


# ශ්‍රී ලංකාවේ කොවිඩ් - 19 තත්ත්වයට අදාළ නීති

සමස්ථ ලෝකයම අද වන විට ගෝලීය වසංගතයකට මුහුණ දෙමින් සිටියි. ඒ හේතුවෙන් ලොව බොහෝ රටවල් හා නගර වසා දැමීමට සිදු වී ඇත.

වෛරසය පැතිරීම වළක්වමින් තත්ත්වය පාලනය කිරීමට ශ්‍රී ලංකා රජය විසින්, තෝරාගත් දිස්ත්‍රික්ක සඳහා මාර්තු 20 සඳුදු සිට 23 සිකුරාද දක්වා ද, අනෙකුත් දිස්ත්‍රික්කවලට 24 වන අඟහරුවාද දින දක්වාද ද දිවයින පුරා ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කරන ලදී. ඇඳිරි නීතිය පැය 8 කට ඉවත් කරන ලද අතර සමාජ සබඳතාවන් අවම කිරීමේ හා වෛරසය පැතිරීම වැළැක්වීමේ අරමුණින් නැවතත් දින 3ක් සඳහා සියලු දිස්ත්‍රික්ක කෙරෙහි ඇඳිරි නීතිය පනවන ලදී. දිස්ත්‍රික්ක අතර ගමනාගමනය ද තහනම් කරන ලදී.

මාර්තු 23 සිට 29 අතර වෛරසය ආසාදනය වූවන් වාර්ථා වීම ඉහළ යාම නිසා කොළඹ, ගම්පහ, කලුතර, පුත්තලම, යාපනය සහ නුවර යන දිස්ත්‍රික්ක සඳහා රජය විසින් දින නියමයකින් තොරව ඇඳිරි නීතිය දීර්ඝ කරන ලදී. අනෙත් සියලු දිස්ත්‍රික්ක තුළ දින කිහිපයකට වරක් උදෑසන 6 සිට දහවල් 2 දක්වා ඇඳිරි නීතිය ඉවත් කර ඉන්පසු නැවත පනවන ලදී.


මෙවැනි අවස්ථාවක වගකීම් සහිත පුරවැසියන් ලෙස, පවත්නා නීතිය අනුගමනය කිරීමට බැඳී සිටීමටත්, තත්ත්වය පාලනය කිරීමට රජය දරනා උත්සහයට සහය දීමටත් යුතුකමක් අප කෙරෙහි පැවරී තිබේ. මෙහි දැක්වෙන්නේ මෙවන් වාතාවරණයක් තුළ දී ඔබ විසින් දැනුවත් වී අවනත විය යුතු රටෙහි බලවත්නා නීති පිළිබඳ මාර්ගෝපදේශයකි.

2020 මාර්තු මස 20 වන දින අංක 2167/18 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් කොරෝනා වෛරසය (කොවිඩ් - 19) නිරෝධායනීය රෝගයක් බවට සෞඛ්‍ය අමාත්‍යංශය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.



# 1897 අංක 3 දරණ නිරෝධායන සහ රෝග වැළක්වීමේ ආඥා පනත

මෙම පනතෙහි අරමුණ වන්නේ බෝවන රෝග ශ්‍රී ලංකාව තුළ ඇති වීම වැළැක්වීම සහ ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත එවන් රෝග පැතිරී යාම වැළැක්වීම යි.



# 3 වගන්තිය

මෙම වගන්තිය යටතේ පවත්නා නීතිවලට අමතරව විෂයභාර අමාත්‍යවරයාට පහත දැක්වෙන කරුණුවලට අදාලව රෙගුලාසි පැනවීමට හැකි ය.

- ගුවන් යානා, නැව් ආදිය මඟින් පුද්ගලයින් හෝ භාණ්ඩ ගොඩබෑසීම තහනම් කිරීම හෝ නියාමනය කිරීම.
- නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලංකාවේ ඕනෑම ගුවන් තොටුපලක් හෝ වරායක් මඟින් ගමන් කිරීමට අදහස්ක රන පුද්ගලයින්ව රඳවා ගැනීම.
- ආසාදිත පුද්ගලයින් රෝහල්වල හෝ වෙනත් ඕනෑම ස්ථානයක වෙන්කොට තැබීම.
- සියළු ආසාදිත අවස්ථා හා ආසාදිත පුද්ගලයින් තනිකර තැබීම.
- රෝගයෙන් මියයන පුද්ගලයින් මිහිදන් කරන හෝ ආදාහනය කරන ආකාරය පිළිබඳව නියම කිරීම.
- යම්කිසි වාසස්ථානයක ජීවත් වීමට අවසර දිය හැකි පුද්ගලයින් සංඛ්‍යාව පාලනය කිරීම.
- රෝගය බෝවෙන ප්‍රදේශවලින් නිරීක්ෂණ හෝ වෙනත් ස්ථානයකට පුද්ගලයින් මාරු කිරීම.
- ආසාදිත පුද්ගලයින්ව වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝහල්වලට හෝ වෙනත් ස්ථානවලට යොමු කිරීම.
- ආරක්ෂාකාරීව රෝහලෙන් මුදා හැරිය හැකි වන තුරු ආසාදිත පුද්ගලයින්ව රඳවා ගැනීම. ආසාදිත පුද්ගලයෙක් වාසය කරන ලද ස්ථාන (සැළකිය යුතු කාලයක්) විෂබීජ හරණයට ලක් කිරීම.
- යම් නිවාසයක හෝ පරිශ්‍රයක රෝග තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව දැනුම් දෙන ලෙසට එම නිවැසියාට හෝ වාසය කරන්නාට නියම කිරීම.

## 4 වන වගන්තියට

අනුව සාධාරණ හෝ විශේෂ නෛතික අවසරයකින් තොරව මෙම නීතිය යටතේ එන රෙගුලාසි උල්ලංඝණය කිරීම හෝ, මෙම නීතිය යටතේ තම රාජකාරි කටයුතු කරන නිළධාරීන්ට බාධා කිරීම වරදක් වේ.

## 5 වන වගන්තිය

අනුව ඉහත දැක්වූ වරද සිදු කරන ලද පුද්ගලයෙක්ට පැනවිය හැකි දඬුවම වන්නේ උපරිමය මාස 6ක් දක්වා වූ සිරදඬුවම හෝ උපරිමය රුපියල් 1000ක් දක්වා වූ දඩය හෝ, ඒ දඬුවම් දෙකම වේ.

## 6 වන වගන්තිය

අනුව මෙම නීතිය යටතේ වරදක් කරන හෝ වරදක් කරන බවට සාධාරණව සැක කළ හැකි ඕනෑම පුද්ගලයෙක්ව වරෙන්තු රහිතව නැවැත්වීමට හා රඳවා ගැනීමට මෙම පනත යටතේ ඕනෑම පරීක්ෂකවරයෙක්ට (PHI ආදි) හෝ පොළිස් නිළධාරියෙකුට බලය හිමි වේ.
එසේම, වරදකරුගේ නම හා ලිපිනය නොදන්නේ නම් ඔහුව වරෙන්තුවක් රහිතව අත් අඩංගුවට ගැනීමට හැකි ය.
මෙම වගන්තිය යටතේ අත් අඩංගුවට ගත් පුද්ගලයෙක්ව ප්‍රායෝගික තත්ත්වය අනුව හැකි ඉක්මණින් මහේස්ත්‍රාත්වරයෙකු හෝ මුල් අවස්ථා අධිකරණ විනිසුරුවරයෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 7 වන වගන්තිය

දක්වන්නේ යම් ආසාදිතයෙක් භාරව සිටින පුද්ගලයෙකු, තමා එසේ රැකබලා ගන්නා පුද්ගලයා ආසාදිත රෝගියෙක් බව දැනුවත්ව සිටින බවට උපකල්පනය කරනු ලබන බව යි. එසේ නොමැති නම්, තමා එසේ දැනුවත්ව නොසිටි බවට හෝ දැන ගැනීමට හැකියාවක් නොතිබූ බවට මහේස්ත්‍රාත්වරයා හෝ මුල අවස්ථා අධිකරණ විනිසුරුවරයා සෑහීමට පත් වන පරිදි එම භාරව සිටින පුද්ගලයා විසින් ඔප්පු කළ යුතු ය.

කොරෝනා වයිරසය මගින් මරනයට පත්වන පුද්ගලයන්ගේ මළසිරුරු භූමදනය නොකල යුතු අතර ආදහනය කල යුතු බවට, 2020, අප්‍රේල් 11වන දින, 2170/08 යන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සෞඛ්‍ය ඇමති රෙගුලාසියක් නිකුත්කර ඇත.


# සැළකිය යුතු යි

ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයෙකු/ආ ගිය අයෙකු/ඔබ සමඟ නවාතැන් ගත් පුද්ගලයෙකු,

- උණ, වියළි කැස්ස, උගුරේ වේදනාව, හුස්ම ගැනීමේ අපහසුතාව ආදි රෝග ලක්ෂණ පෙන්වයි නම්
- කොරෝනා වෛරසය ආසාදනය වූ බවට හඳුනා ගත් පුද්ගලයෙක් සමඟ සම්බන්ධ වී ඇත්නම්
- මෑතක දී විදේශ ගත වී ඇත්නම්
- තදබල ලෙස නිවුමෝනියාවෙන් පෙළෙන්නේ නම්

ඔබ විසින්:

- ඉහත රෝග ලක්ෂණ පවතින්නේ නම් සහ කොරෝනා වෛරසය ආසාදනය වූ බවට හඳුනා ගත් පුද්ගලයෙක් සමඟ සම්බන්ධ වී ඇත්නම්,මෑතක දී විදේශ ගත වී ඇත්නම් හෝ තදබල ලෙස නිවුමෝනියාවෙන් පෙළෙන්නේ නම් වෛද්‍ය උපදෙස් සඳහා ළඟම ඇති රජයේ රෝහල වෙත යොමු වන්න.
- මෑතක දී සිදු කළ විදේශ ගමන් පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරයා වෙත දැනුම් දෙන්න



## 1883 අංක 2 දරණ දණ්ඩ නීති සංග්‍රහය

**262 වගන්තිය** ප්‍රකාරව යම් පුද්ගලයෙක්:

- ජීවිතයට අන්තරාදයක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූ ද
- එලෙස පැතරවිය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූ ද
- යම් ක්‍රියාවක්
- නීති විරෝධීව හෝ නොසැළකිලිමත්ව සිදු කරන්නේ නම්
- 6 මාසය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

**263 වගන්තිය** ප්‍රකාරව යම් පුද්ගලයෙක්:

- ජීවිතයට අන්තරාදයක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූ ද
- එලෙස පැතරවිය හැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූ ද
- යම් ක්‍රියාවක්
- ද්වේෂ සහගතව සිදු කරන්නේ නම්
- අවුරුදු 2 දක්වා කාලයක, දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

**264 වගන්තිය** ප්‍රකාරව යම් පුද්ගලයෙක්:

- යම් යාත්‍රාවක් නිරෝධායන තත්ත්වයක තැබීම සඳහා හෝ
- නිරෝධායන තත්ත්වයක තිබිය දී යාත්‍රාවල වෙරළ සමඟ හෝ වෙනත් යාත්‍රා සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ක්‍රමවත් කිරීම සඳහා හෝ
- බෝවෙන රෝගයක් ඇති ස්ථානයක් වෙනත් ස්ථාන සමඟ ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවය පාලනය කිරීම සඳහා
- ආණ්ඩුව විසින් පනවා ප්‍රසිද්ධ කරනු ලැබූ යම් ව්‍යවස්ථාවකට දැනුවත්ව අකීකරු වීම වරදකි.
- එම වරද කරන පුද්ගලයෙකුට මාස හයක් දක්වා කාලයක්, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගතකිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකෙන්ම දඬුවම් කළ යුතු ය.

# ඇඳිරි නීතිය

රට තුළ ඕනෑම ප්‍රදේශයක් සඳහා ඇඳිරි නීතිය පැනවීමට ජනාධිපතිවරයාට බලය ඇත.

- ඇඳිරි නීතිය බලාත්මකව පවතින අවස්ථාවල දී මහා මාර්ග, මහජන උද්‍යාන, ගොඩනැගිලි හෝ පරිශ්‍ර වැනි පොදු ස්ථානවල රැඳී සිටීමට ඔබට අවසර නැත.
- ඇඳිරි නීතිය පවතින කාලය තුළ ආගමික ක්‍රියාකාරකම්, විවාහ මංගල්‍යයන්, යාඥා, ධර්ම අධ්‍යයන කටයුතු, වන්දනාමාන කිරීම් ආදිය සඳහා ඒකරාශී වීම තහනම් වේ.
- අදාළ බලයලත් අධිකාරීන් විසින් නිකුත් කරන ලද ලිඛිත අවසර පතක් සහිත නම් ඉහත දැක්වූ ක්‍රියාකාරකම්හි නිරත විය හැක.
- සමහර අවස්ථාවල දී රටේ සමහර ප්‍රදේශවලට පමණක් ඇඳිරි නීතිය සීමා විය හැක.
- ඇඳිරි නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

# සැළකිය යුතු යි:

සමාජ දුරස්ථ භාවය (විශාල සංඛ්‍යාවක් එකට එක් නොවීම සහ පොදු ස්ථානවල දී දෙදෙනෙකු අතර මීටරයක පරතරයක් තබා ගැනීම ) පවත්වා ගෙන යාමට රජය විසින් උපදෙස් දී ඇති නිසා, ඇඳිරි නීතිය ඉවත් කළ ද ඔබ විසින් පහත දේ නොකළ යුතු ය.

- මිතුරන් සහ ඥාතින් බැලීමට යාම
- ඔබගේ දේවස්ථානයේ සාමාජිකයින් බැලීමට යාම
- යාඥා මෙහෙයන්, ධර්ම අධ්‍යයන කටයුතු සිදු කිරීම

# 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත

**98 වගන්තිය** අනුව කිසිවකු අනවශ්‍ය ලෙස බියට පත් කිරීම සඳහා වැරදි තොරතුරු  ව්‍යාප්ත කිරීම සහ කැළඹීම් ඇති කිරීම වරදකි.

## එම නිසා ඔබ:

- තොරතුරු පළමුව ප්‍රකාශයට පත් කරන ලද දිනය හා වේලාව සොයා බලන්න.
- තොරතුර ලබා දෙන මූලාශ්‍රය කුමක්දැයි පරීක්ෂා කර බලා, එය විශ්වාසනීය මූලශ්‍රයක් බවට තහවුරු කරගන්න.
- තොරතුරෙහි අදාළතාවය තහවුරු කරගැනීම සඳහා ශීර්ෂ පාඨයෙන් ඔබ්බට අවසානය වනතෙක්ම කියවන්න.
- අනෙකුත් මූලාශ්‍රයන් ද එම තොරතුරම වාර්තා කරන්නේදැයි විමසා බලන්න.
- නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි තොරතුරු,පින්තූර සහ වීඩියෝ බෙදහද ගැනීමෙන් වළකින්න.
- කිසියම් කණ්ඩායමක් ඉලක්ක කරගත් වෛරී ප්‍රකාශ අඩංගු තොරතුරු, පින්තූර හෝ වීඩියෝ බෙදහද ගැනීමෙන් වළකින්න.



**Produced by**

The Religious Liberty and Social Justice Commission of
The National Christian Evangellical Alliance of Sri Lanka

## වැඩිදුර තොරතුරු සඳහා:

**1390** - සෘජු දුරකථන සේවය (Hot line)
**1999** - කොවිඩ් - 19 පිළිබඳ වෛද්‍ය හා වෙනත් උපදෙස්
**1990** - හදිසි අවස්ථාවල දී ගිලන් රථ සේවා
**පිවිසෙන්න - https://hpb.health.gov.lk/en**

NATIONAL CHRISTIAN
EVANGELICAL ALLIANCE SRI LANKA
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය
இலங்கை தேசிய கிறிஸ்தவ சுவிசேஷக ஐக்கியத்துவம்
*(Established in 1952)*